ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>කොළඹ ආරක්ෂක පර්ෂදයේ ආරම්භක ලේඛන සඳහා අත්සන් තැබේ</u>

ඉන්දීය ජනරජයේ අග්‍රාමාත්‍යතුමාගේ ජාතික ආරක්ෂක උපදේශක වන කීර්ති චක්‍ර අජිත් දොවාල් මහතා කොළඹ ආරක්ෂක පර්ෂදයේ ආරම්භක ලේඛන අත්සන් තැබීම සඳහා 2024 අගෝස්තු 29-30 දිනවල කොළඹ සංචාරයක නිරත විය.

2. 2023 දෙසැම්බර් මස මොරිෂස් රාජ්‍යයේ පැවති හය වන ජාතික ආරක්ෂක උපදේශක මට්ටමේ සාකච්ඡා වලින් අනතුරුව ඉන්දියාව, මාලදිවයින, මොරිෂස් රාජ්‍යය සහ ශ්‍රී ලංකාව විසින් කොළඹ ආරක්ෂක පර්ෂද ලේකම් කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා ප්‍රඥප්තියට සහ අවබෝධතා ගිවිසුමට 2024 අගෝස්තු 30 වන දින කොළඹ දී අත්සන් තබන ලදී.

3. ජාතික ආරක්ෂක උපදේශක කීර්ති චක්‍ර අජිත් දොවාල් මහතා කලාපීය ආරක්ෂාව සහ ස්ථාවරත්වය සහතික කිරීමෙහිලා කොළඹ ආරක්ෂක පර්ෂදයේ වැදගත් කාර්යභාරය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ආරම්භක ලේඛනවල වැදගත්කම ඉස්මතු කළේය. සහයෝගීතාවයේ විවිධ කුළුණු හරහා තිරසාර නියැළීම සහතික කිරීමෙහිලා කොළඹ ආරක්ෂක පර්ෂදයේ භූමිකාව අවධාරණය කරමින් එතුමා ඉන්දීය සාගර කලාපයේ සාම්ප්‍රදායික, සාම්ප්‍රදායික නොවන

සහ නැගීඑන දෙමුහුන් අභියෝගයන්ට මුහුණ දීම සඳහා සාමූහික ප්‍රයත්නයන්හි වැදගත්කම අවධාරණය කළේය.

4. ජාතික ආරක්ෂක උපදේශක කීර්ති චක්‍ර අජිත් දොවාල් මහතා සිය ශ්‍රී ලංකා සංචාරය අතරතුර ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු රනිල් වික්‍රමසිංහ මහතා සහ ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා හමු විය. එසේම එතුමා ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂක උපදේශක ගරු සාගල රත්නායක මහතා සහ මාලදිවයිනේ ජාතික ආරක්ෂක උපදේශක ගරු ඉබ්‍රාහිම් ලතීෆ් මහතා ඇතුළු කොළඹ ආරක්ෂක පර්ෂදයේ සාමාජික රටවල ජාතික ආරක්ෂක උපදේශකවරු හමු විය. කොළඹ සිටි කාලය තුළ ජාතික ආරක්ෂක උපදේශක කීර්ති චක්‍ර අජිත් දොවාල් මහතා විපක්ෂ නායක සහ සමගි ජන බලවේගයේ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා සහ ජාතික ජන බලවේගයේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර කුමාර දිසානායක මහතා මෙන්ම උතුරු, නැගෙනහිර සහ වතුකර ප්‍රදේශ ඇතුළු විවිධ දේශපාලන නායකයන් සහ නියෝජිතයන් ද හමු විය.

***

***කොළඹ***
***2024 අගෝස්තු 30***